# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.05.03 පැය 0550 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/906/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>**

**01. මනුෂ්‍ය ඝාතනයක් - සීගිරිය පොලිස් වසම**

2025.05.02 වන දින රාත්‍රී කාලයේ සීගිරිය පොලිස් වසමේ හේන්වලයාගම, කිඹිස්ස ප්‍රදේශයේ අවමංගල්‍ය උත්සවයකට සහභාගි වීමට පැමිණි සිටි පුද්ගලයෙකුට තවත් පුද්ගලයෙක් විසින් තියුණු ආයුධයකින් පහරදීම හේතුවෙන් බරපතල තුවාල ලබා කිඹිස්ස රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති බවට සීගිරිය පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමශර්න ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 55 ක් වූ හේන්වලයාගම, කිඹිස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු හා සැකකරු අතර කලක සිට තිබූ පුද්ගලික ආරවුලක් මත මෙම ඝාතනය සිදුකර ඇති බවට දැනට සිදුකරන ලද විමශර්නයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය කිඹිස්ස රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා සීගිරිය පොලිසිය වැඩිදුර විමශර්න සිදු කර ගෙන යනු ලබයි.

**02. මනුෂ්‍ය ඝාතනයක් සිදුකිරීමට ආධාර අනුබල දුන් සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2025.05.01 වන දින දහවල් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ හුළුදාගොඩ මාගර්යේ පාලු ඉඩමක් තුල පුද්ගලයෙකු කපා කොටා ඝාතනය කිරීමක් සම්බන්ධයෙන් ගල්කිස්ස පොලිසිය විමශර්න ආරම්භ කර තිබුණි.

ඒ අනුව මෙම ඝාතනයට ආධාර අනුබල දුන් සැකකරුවෙකු 2025.05.02 වන දින සවස් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ බඩෝවිට ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 23 ක් වන බඩෝවිට, ගල්කිස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරුගෙන් සිදුකරන ලද වැඩිදුර ප්‍රකාශ මත අපරාධයට උපයෝගී කරගත් ත්‍රිරෝද රථයද පොලිස් භාරයට ගෙන ඇත. ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

## 03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකාරියක් අත්අඩංගුවට - අනුරාධපුර පොලිස් ස්ථානය.

2025.05.02 වන දින උදෑසන කාලයේ අනුරාධපුර පොලිස් වසමේ මිහිඳුපුර ප්‍රදේශයේදී අනුරාධපුර පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 20 ක් සමඟ සැකකාරියක්** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකාරිය වයස අවුරුදු 24 ක් වන අනුරාධපුර ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

අනුරාධපුර පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 04. අයිස් මත්ද්‍රව්‍ය හා හෙරොයින් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.

2025.05.02 වන දින දහවල් හා සවස් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ රත්මලාන දුම්රියපොල හා ගල්කිස්ස දුම්රියපොල අසලදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් දෙකක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 500 ක් සමඟ සැකකරුවෙකු හා හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 350 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 35 හා 38 වයස්වල පසුවන මොරටුව හා මඩපාත ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 05. හෙරොයින් සමඟ සැකකාරියක් අත්අඩංගුවට - මොරටුව පොලිස් ස්ථානය.

2025.05.02 වන දින රාත්‍රී කාලයේ මොරටුව පොලිස් වසමේ කොරළවැල්ල ප්‍රදේශයේදී මොරටුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 370 ක් සමඟ සැකකාරියක්** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකාරිය වයස අවුරුදු 44 ක් වන මොරටුව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මොරටුව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 06. කේරළ ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මොරටුව පොලිස් ස්ථානය.

2025.05.02 වන දින රාත්‍රී කාලයේ මොරටුව පොලිස් වසමේ ලුනාව ප්‍රදේශයේදී මොරටුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **කේරළ ගංජා කිලෝ 02 ග්‍රෑම් 50 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 50 ක් වන උයන පාර, ලුනාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොරටුව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**07. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් හා ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - අරලගංවිල පොලිස් ස්ථානය.**

2025.05.02 වන දින දහවල් කාලයේ අරලගංවිල පොලිස් වසමේ ඇල්ලේවැව ප්‍රදේශයේදී අරලගංවිල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් හා නීති විරෝධී මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා ලීටර් 18 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 33 ක් වන ඇල්ලේවැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අරලගංවිල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**